**ශීර්ෂය 114 - ප්‍රවාහන අමාත්‍යාංශය**
**-------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන
**---------------**

### 1.1 තත්ත්වාගණනය කළ මතය
**-----------------------------**

ප්‍රවාහන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 29 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 ජූලි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ මෙම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රවාහන අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
**---------------------------------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම
**---------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කර ගන්නා බවට තහවුරු කිරිමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛණ සැකසීම, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතු වන බැවිනි.
- අමාත්‍යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුලදී හදුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ). මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වන බව,

(ආ). ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

## 1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මූල්‍ය නොවන වත්කම් පිළිබඳ සංචලන වාර්තාව හා භාණ්ඩාගාර පරිගණක මුද්‍රිත අනුව පහත වෙනස්කම් නිරීක්ෂණය විය. | | |
| (i) කෙරීගෙන යන වැඩ හා ගොඩනැගිලි ඉදිකිරීම්වල ආරම්භක ශේෂයේ රු. 2,929,603,168 ක හා ඒවා මිළදී ගැනීම්වල රු. 2,487,609,734 ක වෙනසක් පැවතුණි. | දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පොත් අනුව වෙනසක් අනාවරණය වූ විට එම වෙනසට හේතු පරීක්ෂා කර නිවැරදි කිරීම් සිදුකළ යුතු වීම. | 2104 වැය විෂය යටතේ දරන ලද සෘජු වියදම්වල වටිනාකම වන බව. |
| (ii) ඉඩම්වල ආරම්භක ශේෂයේ රු. 355,261,405 ක හා ඒවා මිලදී ගැනීම් රු. 679,014,041 ක අතර වෙනස්කම් පැවතුණි. | -එම- | -එම- |

## 1.6.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **නීති,රීති හා රෙගුලාසි වලට යොමුව** | **අනුකූල නොවීම** | | |
| <u>**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**</u> | | | |
| (අ) මුදල් රෙගුලාසි අංක 104 (3) හා (4) | 2018 වසරට අදාළ වාහන අනතුරු 02 කද, 2019 වර්ෂයට අදාළ වාහන අනතුරු 12 කද හානි හා පාඩු නිශ්චය කර නොතිබුණි. | හානියක් හා පාඩුවක් වාර්තා වූ වහාම පරීක්ෂණ ආරම්භ කිරීමට පියවර ගත යුතු වීම. | වාහන අනතුරු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව ඉදිරියේදී කටයුතු කරන බව. |
| (ආ) මුදල් රෙගුලාසි 126 හා 127 | වත්කම් ආරක්ෂා කිරීමේ වගකීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සතු වගකීමක් වුවද, රු. 3,500,000 ක් වටිනා අනතුරකට පත් වාහනයක් දීර්ඝ කාලයක් තිස්සේ අළුත්වැඩියා නොකර ගාල්කර ඇත. | වත්කම්වල ආරක්ෂාව සැලසීමට අවශ්‍ය පියවර ගත යුතු වීම. | රක්ෂණ ආවරණ මගින් අළුත්වැඩියා කිරීමට රක්ෂණ ආයතනය සමඟ සාකච්ඡා පවත්වමින් සිටින බව. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

**2.1** **වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | පුනරාවර්තන වැය විෂයන් 04 ක් සඳහා පරිපූරක ඇස්තමේන්තු මඟින් රු.1,600,000 ක් මාරු කරගෙන තිබුණද එම මුළු ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි. | ලබාගත් ප්‍රතිපාදන නිශ්චිත කාර්යය සඳහා යෙදවීමට වගබලා ගත යුතු වීම. | මුදල් රෙගුලාසි 66 මගින් ලබාගත් ප්‍රතිපාදනවලින් වියදම් පාලනය කරගත් බව. |
| (ආ) | ඇස්තමේන්තු සැකසීමේදී වියදම් නිවැරදිව පුරෝකථනය නොකිරීම නිසා පුනරාවර්තන වැය විෂයක හා ප්‍රාග්ධන වැය විෂයයන් 06 ක ශුද්ධ ප්‍රතිපාදන සියයට 72 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. | ලබාගත් ප්‍රතිපාදන උපරිම කාර්යක්ෂමතාවයකින් යුතුව යෙදිය යුතු වන අතර ප්‍රතිපාදන ඉතිරි වේනම් එය ඵලදායී කාර්යයක් සඳහා යෙදවිය යුතු වීම. | -එම- |

**2.2** **බැරකම් හා බැඳීම්වලට එළඹීම.**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයට අදාළ රු. 10,156,579 ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | වියදම් සඳහා සලසා ඇති ප්‍රතිපාදන ඉක්මවා නොයන ලෙසට බැරකම්වලට එළඹිය යුතු වීම. | CIGAS වැඩසටහනේ පවතින සීමාකම් නිසා මෙය සිදු වී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

----------------------------

### 3.1 ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන්

---------------------------------

අමාත්‍යාංශය විසින් සිදු කරනු ලබන පහත සඳහන් ව්‍යාපෘති ඉටු කිරීමේ ප්‍රමාදයන් නිරීක්ෂණය විය.

**(අ)** **කුරුණෑගල, දඹුල්ල හරහා හබරණ දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය.**

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **(i)** | මෙම ව්‍යාපෘතියේ 2019 වසර අවසානයට ඉඩම් අත්පත් කර ගැනීමේ ඉලක්කය සියයට 17.1 ක් වුවද, ප්‍රගති වාර්තා අනුව එහි ප්‍රගතිය සියයට 10.4 ක් වී තිබුණි. මේ අනුව මෙම ව්‍යාපෘතියේ කාර්යසාධනය දුර්වල මට්ටමක පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය. | ව්‍යාපෘතියේ කටයුතු කඩිනම් කිරීම මගින් ප්‍රගතිය වැඩිකර ගැනීමට කටයුතු කළ යුතු වීම. | අමාත්‍යාංශ හා අමාත්‍යවරුන්ගේ නම් වෙනස්වීම නිසා ලිපිගොනු නැවත සකස් කර ගැසට් කිරීමට සිදුවීම නිසා යම් ප්‍රමාදයක් සිදු වූ බව. |
| **(ii)** | මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් 2019 ජූලි මස සිට මසකට රු. 55,000 ක් ගෙවීමේ පොරොන්දුව මත පෞද්ගලික නිවසක් කුලියට ලබාගෙන තිබූ අතර පැරණි අමාත්‍යාංශ ගොඩනැගිල්ලේද මෙම ව්‍යාපෘතිය සඳහා තවත් කාර්යාලයක් පවත්වා ගෙන තිබුණි. | විකල්ප අවස්ථාවන් ගැන සලකා බලමින් වියදම් අවම කර ගැනීමට කටයුතු කළ යුතු වීම. | කුලියට ගත් නිවස සාකච්ඡා පැවත්වීමට හා ඉංජිනේරු කාර්ය මණ්ඩලය සඳහා යොදවා ඇති බව. |

(ආ) <u>මාතර කතරගම නව දුම්රිය මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය.</u>

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ---------------------- | ------------ | ----------------------- |
| **(i)** මාතර, දෙවිනුවර, දික්වැල්ල, බෙලිඅත්ත හා තංගල්ල යන ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් රජයේ තක්සේරුකරුගේ තක්සේරුව මත ඉඩම් පවරා ගැනීම සිදු කළ යුතු වුවත් ඊට අනුකූලව කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. එහිදී අදාල ඉඩම් ව්‍යාපෘතියට ලබා දීමට එකඟ නොවුණහොත් වන්දි ගෙවීමකින් තොරව එම ඉඩම් පවරා ගන්නා බවට අදාල පාර්ශ්වයන්ව දැනුවත් කර ඇති බව වාර්තා වී තිබුණි. ඒ අනුව ඉඩම් හිමියන්ගේ ඉඩම් පලමුව අතරමැදි පුද්ගලයින් විසින් අඩු වටිනාකමට පවරා ගැනීමෙන් පසුව ඔවුන්ගෙන් වැඩි වටිනාකමකට පරිත්‍යාග වශයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරවරයාට පවරා ඇති බවට අදාළ පත්ඉරු පරීක්‍ෂාවේදී නිරීක්ෂණය විය. | මේ පිළිබඳ සොයා බැලීමක් සිදුකර නිවැරදි නොවන තොරතුරු ලබාදීම මගින් ඉඩම් පවරාගත් අය සම්බන්ධව විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. | දුම්රිය දෙපාර්තමේන්තුවේ ඉඩම් නිලධාරීන් හා විමර්ශන නිලධාරීන් යොදවා වහාම පරීක්ෂණයක් සිදුකරන බව. |
| **(ii)** මෙම ව්‍යාපෘතිය යටතේ ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට විධිමත් ආකාරයට පවරාගත් ඉඩම්වලට අමතරව පැවරුම් ඔප්පු 62 ක් යටතේ එකතුව රු.57,580,854 ක් වූ අක්කර 4 පර්චස් 31.37 ක ඉඩම් ප්‍රමාණයක් අතරමැදි ගැණුම්කරුවන්ගෙන් ලබාගෙන තිබුණු අතර, ඒවා ව්‍යාපෘති කටයුතු සඳහා භාවිතා නොකර නිෂ්කාර්යව පැවතුණි. | ඉඩම් පවරා ගැනීමට හේතු වූ කාර්යයන් කොන්ත්‍රාත්කරුලවා ඉටුකරවා ගැනීම කඩිනම් කල යුතු වීම. | මේ පිළිබඳව තොරතුරු ව්‍යාපෘති කාර්යාලයේ නොමැති බව. |

| | | | |
|---|---|---|---|
| **(iii)** | බෙලිඅත්ත දුම්රිය නැවතුම් ස්ථානය ආසන්නයෙන් ව්‍යාපෘතියට පවරාගෙන තිබුණු ඉඩම් කොටස් කිහිපයක් පුද්ගලයින් තිදෙනෙකු විසින් අනවසරයෙන් භුක්ති විදින බව නිරීක්ෂණය විය. ඒ හේතුවෙන් දුම්රිය මාර්ගය සකස් කිරීමේ මූලික සැලසුම් අනුව Buffer Line 05 ක් සකස් කිරීම, Buffer Line 04 ක් දක්වා අඩුකිරීමට සිදු වී තිබුණු අතර, අනවසරයෙන් භුක්තිවිදින ඉඩම් ආපසු ලබා ගැනීමට දුම්රිය දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. | අනවසර පදිංචිකරුවන්ගෙන් එම ඉඩම් නැවත ලබාගෙන දුම්රිය මාර්ගය දියුණු කිරීම හා අදාළ ඉදිකිරීම සිදු කළ යුතු වීම. | අනවසර ඉඩම් අත්පත්කර ගැනීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් දැනුවත් කර ඇත. |
| **(iv)** | ණය ගිවිසුම් කොන්දේසි 1.3 ප්‍රකාරව ණය ගිවිසුම අත්සන් කළ දින සිට වසර 04 ක් ඇතුලත ණය මුදල ලබාගත යුතු විය. ණය ගිවිසුම 2013 අප්‍රේල් මස අත්සන් කර තිබූ අතර 2017 අප්‍රේල් මස අවසන් වන විට මුළු ණය මුදල ලබාගත යුතු විය. එහෙත් ඉදිකිරීම් ප්‍රමාදය මත 2017 මැයි මස සිට 2018 දෙසැම්බර් 31 දක්වා කාලසීමාව තුල කරන ලද ගෙවීම් සඳහා රු.මිලියන 2,207.6 ක විදේශ විනිමය අලාභයක් සිදු වී තිබුණි. | ඉදිකිරීම් ප්‍රමාදය මත වන විනිමය අලාභයන් අවාරණය කරගත හැකි ආකාරයට ගිවිසුම්ගතවීමට පෙර අදාල එකඟතාවයන් ඇතිකර ගත යුතු වීම. | මුල් සැලැස්මට සංඥා හා විදුලි පද්ධති ඇතුලත් වී නොතිබුණු බැවින් 2017 වසරේ සිට ව්‍යාපෘති කාලසීමාව වෙනස් කර ඇති බව. |

**(ඇ)** <u>**කොළඹ තදාසන්න දුම්රිය ව්‍යාපෘතිය**</u>

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| | --------------------- | ------------ | ---------------------- |
| **(i)** | ව්‍යාපෘතියේ ශක්‍යතා අධ්‍යයනය හා සවිස්තරාත්මක නිර්මාණ සැකසීම වෙනුවෙන් ආසියානු සංවර්ධන බැංකු අරමුදලින් | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් සංඛ්‍යා නිවැරදි විය යුතු අතර වෙනස්කම් ඇතොත් ඊට හේතු පැහැදිලි කළ යුතු වීම. | වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරම් (Mobilization advance) අයකර ගැනීම් ඇතුලත්වීම. |

| | | | |
|---|---|---|---|
| | ගෙවන ලද උපදේශක දීමනා සම්බන්ධව මූල්‍ය ප්‍රකාශන වල ඇතුලත් සංඛ්‍යාවන් හා ව්‍යාපෘති කාර්යාලය විසින් ඉදිරිපත් කළ සංඛ්‍යා අතර රු. 38,189,184 ක වෙනසක් නිරීක්ෂණය විය. | | |
| **(ii)** | කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ 2016 මාර්තු 24 දිනැති (2019 මාර්තු 18 දින සංශෝධනය කරන ලද) චක්‍රලේඛයේ පළමු කොටසේ වගු අංක 01 අනුව මූලික අයෝජනය ඇමරිකානු ඩොලර් මිලියන 15 ට අඩු ව්‍යාපෘති සඳහා අදාළවන පරිදි ව්‍යාපෘති කාර්ය මණ්ඩලය වැටුප් ගෙවිය යුතුව තිබුණි. නමුත් 2018 මැයි 18 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයත් පදනම් කරගෙන ඉදිරියේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඇමරිකානු ඩොලර් මිලියන 135 ක ව්‍යාපෘතියක් පදනම් කරගෙන කළමණාකරන සේවා චක්‍රලේඛයේ වගු අංක 01 හි දක්වා ඇති සීමාවන් මත පදනම්ව එනම් ඇමරිකානු ඩොලර් මිලියන 100 ක් ණය ආයෝජන ලෙස සලකා ව්‍යාපෘති කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවා තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාර්ය මණ්ඩලය 38 ක් සඳහා වැඩියෙන් ගෙවා තිබූ වැටුප් රු. මිලියන 12.89 ක් බව නිරීක්ෂණය විය. තවද පෙර වර්ෂයේ එලෙස වැඩියෙන් ගෙවන ලද රු.මිලියන 449 ක වැටුප් සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | චක්‍රලේඛවලට අනුකූල වන පරිදි වැටුප් ගෙවීමට කටයුතු කළ යුතු වීම. | මේ සම්බන්ධයෙන් 2018 අවසන් ගිණුම තුලින්ද විමසා තිබූ බවත්, ඒ සඳහා දීර්ඝ සාකච්ඡාවක් සිදුකළ බවත් විගණනයේ ඉහළ නිලධාරීන් සමඟ සාකච්ඡා කර පවසන බවත් දැන්වූවත්, එසේ සිදු නොකළ නිසා අපදුන් පිළිතුරු විගණනයේදී පිළිගත් බවට අප සලකා ඇත.<br>කළමනාකරණ සේවා චක්‍රලේඛ පරිදි අදාළ වැටුප් පියවරේ තබා ගෙවීම් සිදුකරන ලදී. |
| **(iii)** | උපදේශන සේවා ගිවිසුමේ ඇමුණුම D අනුව උපදේශන සමාගම විසින් නිශ්චිතව දක්වා ඇති කාල රාමුවට අනුව වාර්තා ඉදිරිපත් කළ යුතු අතර, ඒ අනුව | කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසිවලට අනුකූලව ගෙවීම් කළ යුතු වීම. | ගිවිසුම කාල පදනම මත පවතී. ගෙවීම් සිදුකිරීම 45.1 කොන්දේසිය මත සිදුවේ. කෙසේ වෙතත් වර්ෂය තුලදී ගෙවන ලද |

| | | |
|---|---|---|
| ගෙවීම් සිදුකළ යුතු විය. එහෙත් සමාලෝචිත වර්ෂයේදී උපදේශන සමාගම වෙත ගෙවන ලද රු. 390,220,493 ක මුදල මාසික පදනම මත සිදුකර තිබූ බව නිරීක්ෂණය විය. මේ අනුව මෙය ගෙවීම් කොන්ත්‍රාත් ගිවිසුමේ කොන්දේසි උල්ලංඝනය කිරීමක් බව වැඩිදුරටත් නිරීක්ෂණය විය. | | උපදේශන සේවා ගාස්තු ප්‍රතිශතය ඉක්මවා ගොස් නොමැත. |

**3.2 වත්කම් කළමනාකරණය.**

---------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| --------------------- | ------------ | --------------------------- |
| අමාත්‍යාංශය සතු වාහන 05 ක් අපහරණය කිරීමට යෝජිත බව නිර්දේශ කර තිබියදී, එම වාහන අපහරණය කිරීමට අමාත්‍යාංශය පියවර ගෙන නොතිබුණි. මේ පිළිබඳ අංක 02/2015 හා 2015 ජූලි 10 දිනැති රාජ්‍ය ආයතනවල අබලන් වාහන භාවිතයෙන් ඉවත්කිරීම මැයෙන් මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද චක්‍රලේඛයේ 12 වන ඡේදය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවනු කැමත්තෙමි. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | වාහන 04 ගමනාගමන මණ්ඩලය වෙත තක්සේරු මුදල ගෙවීමේ පදනම මත ලබා දී ඇති බවත් අනෙක් වාහනය අපහරණය කිරීමට කටයුතු කරනු ලැබේ. |

**3.3 හානි හා පාඩු**

--------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| -------------------- | | ------------ | ------------------------ |
| (අ) | සමාලෝචිත වර්ෂයේ සිදු වූ රිය අනතුරු 19 න් අනතුරු 07 ක වටිනාකම තක්සේරු කර තිබුණද, ඒ අනතුරු සම්බන්ධවද මූලික පරීක්ෂණ සිදුකර මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව වාර්තා නිකුත් කිරීමට පියවර ගෙන නොතිබුණි. | මුදල් රෙගුලාසි 104 ප්‍රකාර කටයුතු කළ යුතු වීම. | හදිසි අනතුරු 12 ක අඩුපාඩු පවතින බැවින් පරීක්ෂණ නිම කිරීමට නොහැකි වූ බව. |

| | | |
|---|---|---|
| (ආ) **WP-KA 1279** දරන ලෑන්ඩ් කෲෂර් වර්ගයේ ජීප් රථය 2019 පෙබරවාරි මස 28 දින කුරුණෑගල සාරිගම මාර්ගයේදී අනතුරකට ලක් වී තිබුණි. මේ පිළිබඳව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් මූලික පරීක්ෂණ පවත්වා අවසාන වාර්තාව නිකුත් කර නොතිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | මූලික පරීක්ෂණ සිදු කර ඇතත් අදාල වාහනය අළුත්වැඩියා කර නොමැති නිසා පරීක්ෂණ නිමකළ නොහැකි බව. |
| (ඇ) ඉහත (ආ) හි සඳහන් වාහනය සම්බන්ධයෙන් වූ හිමිකම් ඉල්ලීම ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව ප්‍රතික්ෂේප කර තිබූ අතර ඊට හේතු වශයෙන් දක්වා තිබුණේ අනතුර සිදුවන අවස්ථාවේ වාහනය ධාවනය කළ රියදුරු මත්පැන් පානය කර ඇති බව ඔහු විසින්ම පිළිගෙන ඇති බවය. | සිදු වූ අලාභය අදාළ පාර්ශවයන්ගෙන් අයකර ගත යුතු වීම. | මෙම හදිසි අනතුර සම්බන්ධව වන්දි ලබාදීම ප්‍රතික්ෂේප කර ඇති බව. |

**3.4 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**-----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|
| **---------------------** | **-------------** | **-----------------------** |
| (අ) අංක KE 8966 දරන මිට්ෂුබිෂි වර්ගයේ ජීප් රථය 2012 වසරේ සිට ජල සම්පාදන හා ජල ප්‍රවාහන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්වරයෙකුට අනුයුක්ත කර ඇති බව 2019 දෙසැම්බර් 31 දිනට වූ අමාත්‍යාංශ ප්‍රවාහන ඇණිය පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. එමෙන්ම අමාත්‍යාංශය යටතේ පවතින කුරුණෑගල හරහා හබරණ දක්වා දුම්රිය මාර්ග ව්‍යාපෘතිය සඳහා 2018 හා 2019 වසරවලදී වාහන 03 ක් කුලියට ගෙන මුදල් ගෙවා තිබුණි. | අමාත්‍යාංශය සතු සම්පත් බාහිර ආයතන වෙත නිදහස් කිරීමට පෙර අමාත්‍යාංශයේ අවශ්‍යතා සඳහා යෙදවීමට කටයුතු කළ යුතු වීම. | නැවත අමාත්‍යාංශය වෙත ලබාගැනීමට කටයුතු කරමින් සිටින බව. |

| | | |
|---|---|---|
| (ආ) සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ මණ්ඩල වාර්තාව අනුව අමාත්‍යාංශය යටතේ පවතින උප ඒකක 23 ක භාණ්ඩ වර්ග 1,039 ක ඌනතාවයන් දක්නට ලැබුණි. | ඌනතාවයන්ට හේතු සොයා බලා අවශ්‍ය පියවර ගත යුතු වීම. | එක් එක් අංශ මගින් තොරතුරු ලබා ගැනීමටත්, නැවත Barcode අංක ලබාදීමත් සිදුකරන බව. |

**4.** **තිරසර සංවර්ධන අරමුණු**

-----------------------------

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කිසියම් කාර්යයක නිවැරදි කාර්යසාධනය මැනීම සඳහා නිවැරදි දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත්, ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහිකරගැනීමට කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය. | නිවැරදි දත්ත පදනමක් ඇති කරගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදි දත්ත පදනමක් ඇතිකර ගැනීමට කටයුතු කරන බව. |

**5.** **මානව සම්පත් කළමනාකරණය.**

--------------------------------

පහත දැක්වෙන කරුණු නිරීක්ෂණය විය.

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 07 ක පුරප්පාඩු පැවතියදී එම පුරප්පාඩු සම්පූර්ණ කිරීමට හෝ එම තනතුරු අනවශ්‍යනම් ඒවා අහෝසි කිරීමට හෝ පියවර ගෙන නොතිබුණි. | පුරප්පාඩු පිරවීමට හෝ ඒවා අනවශ්‍ය බවට හැඟීයන්නේ නම් අහෝසි කිරීමට කටයුතු කළ යුතු වීම. | පුරප්පාඩු පිරවීමට අදාළ ඉල්ලීම් සිදුකර ඇත. |
| (ආ) ද්විතීයික මට්ටමේ පුරප්පාඩු 34 ක් හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 16 ක් පැවතියදී එම පුරප්පාඩු කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත දන්වා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කර නොතිබුණි. | -එම- | ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ වෙතින් පුරප්පාඩු පිරවීමට ඉල්ලීම් කර ඇත. |
| (ඇ) මෙම අමාත්‍යාංශය යටතේ ඇති ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය හා ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිලධාරීන් 35 දෙනෙකු අමාත්‍යාංශයට අනුයුක්ත කර සේවයේ යොදවා ගෙන තිබුණි. | -එම- | අවශ්‍යතාවය මත අනුයුක්ත කරගෙන ඇති පුරප්පාඩු සම්පූර්ණ වූ පසුව මුදා හැරීමට කටයුතු කරන බව. |